**22-09-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ නුවණැත්තන් වී ඇත, එබැවින් ආදායමක් උපයා ගැනීමට ඔබට විශාල උනන්දුවක් තිබිය යුතුයි. ඔබගේ කාර්යයන් සිදුකරන අතර, පරම පියා සිහිපත් කිරීමට කාලය සාදාගන්න, එවිට ඔබ අඛණ්ඩව ආදායමක් උපයා ගනී.

**ප්‍රශ්නය:** පෙර ඔබට නොලැබුණු, මෙකල ඔය දරුවන්ට ලැබෙන, ශ්‍රීමත් මොනවාද?

**පිළිතුර:** මෙකල පියා ඔබට මෙම ශ්‍රීමත් ලබා දෙයි:1) සුමිහිරි දරුවනි, හිමිදිරි උදෑසන අවදි වී, පියාගේ සිහිපත් කිරීමේ අසුන් ගන්න, එවිට ඔබගේ සම්පූර්ණ උරුමය හිමි කරගැනීමට ඔබට හැකියාව ලැබෙයි. 2) නිවසේ ජීවත් වන අතර, නෙළුම් මලක් මෙන් රැඳී සිටින්න. මෙවන් ශ්‍රීමත්, ඔබට වෙනත් කිසිම ආධ්‍යාත්මික හමුවකදී නොලැබෙයි. එම ආධ්‍යාත්මික හමුවීම්වල, පියා සහ උරුමය පිළිබඳ ප්‍රශ්නයක් නැත.

**ගීතය:** මවත් ඔබයි, පියාත් ඔබයි!

ඕම් ශාන්ති. විශේෂයෙන් භාරතයෙත්, සාමාන්‍යයෙන් ලෝකයෙත් බොහෝ විවිධ අන්දමේ ආධ්‍යාත්මික රැස්වීම් තිබේ. පන්සල් හෝ පල්ලි ආදියේ පවත්වන ආධ්‍යාත්මික රැස්වීම්වල, මිනිසුන්ගේ බුද්ධිය තුළ, ඔවුන් උරුමයක් හිමි කරගන්නා බව නොමැත. ඔය දරුවන් මෙහි අසුන්ගෙන සිටිනවා. සියලුම මධ්‍යස්ථානවල, ඔවුන්ගේ පියාගෙන්, සතුටු දේශයේ උරුමය හිමි කරගන්නා සිතිවිල්ල ඇතිව, දරුවන් අසීමිත පියාගේ සිහි කිරීමේ අසුන් ගෙන සිටිනවා. කිසිදු ආධ්‍යාත්මික රැස්වීමක හෝ පල්ලියක ආදියේ, ඔවුන් මෙය විශ්වාස කරන්නේ නැත ඔය දරුවන්ගේ බුද්ධිය තුළ එය ඇත. ඔබ අසීමිත පියාගේ සිහි කිරීමේ අසුන්ගෙන සිටින බව, ඔය දරුවන් දන්නවා. ඔබ දෙව්ලොව, නව ලෝකයේ ඔබගේ උරුමය හිමි කරගන්නවා. සියලුම දරුවන්, එක් පියාගෙන් උරුමයක් හිමි කරගන්නවා. බොහෝ දරුවන් සිටින අතර මෙම සංඛ්‍යාව අඛණ්ඩව වර්ධනය වනවා. ඔබ සෑම කෙනෙකුටම ශ්‍රීමත් ලැබෙයි හිමිදිරි උදයෙන් අවදි වී, පියා සිහි කරන්න. බාබාගෙන් අපි මෙම උරුමය හිමි කරගැනීමට යනවා. අප එම පියාට අයත්ය. ජීවාත්මයට දැන් පියාගෙන් හැඳින්වීම ලැබී තිබේ. පියා ඔබට මෙම උපදෙස ලබා දෙයි මා සිහිපත් කරන්න, එමෙන්ම නිවසේ ජීවත් වන අතර නෙළුම් මලක් මෙන් පිවිතුරුව රැඳෙන්න. සෑම කෙනෙක්ම පැමිණ, මෙහි සිටිය යුතු නැහැ. ඔබ ඉගෙනගැනීමට පාසැල් ගොස් ඉන්පසුව ආපසු නිවසට යයි. සෑම දරුවෙකුටම ඇය හෝ ඔහුගේ ගුරුවරයාගෙන් උරුමයක් හිමි කරගත හැක. මෙහිද එය එසේමයි. ඔබ දිනපතා ඉගෙනගෙන, ඉන්පසුව ආපසු ගොස්, වැඩට ආදියට යා හැක. ඔබ නිවසේ වාසය කරන අතර ශිෂ්‍යයන්ද වෙයි. නිවසේ වාසය කරන අතර, නෙළුම් මලක් මෙන් පිවිතුරු වන්න. කිසිදු සන්‍යාසී කෙනෙක් මෙසේ නොකියයි. ඔබ ප්‍රායෝගිකව මෙහි අසුන්ගෙන සිටිනවා. ඔබ ගෘහයක වාසය කරන අතර පිවිතුරු වෙයි. වෙනත් කිසිවෙකු පිවිතුරු වී, පරම පියා, පරමාත්ම ජීවය සිහි කරන්නේ නැත. ඔවුන් ගීතාවට සවන් දී, එය හදාරන නමුත්, ඔවුන් ඔහු සිහි කරන්නේ නැත. ඔවුන් පවසන දේ සහ කරන දේ අතර වෙනසක් තිබේ. අපගේ පියා, දැනුමින් පිරී ඇති බව, ඔබ දන්නවා. ඔහුට නාටකයේ මුළු චක්‍රයම පිළිබඳ දැනුම තිබේ. අපත් දැන් මෙම දැනුම ලබනවා. මෙම චක්‍රය ඉතා හොඳය. මෙය වඩාත් ශුභදායක සංගම යුගය බැවින්, ඔබගේ මෙම උපතද, වඩාත්ම උසස් එකය. අධික මාසය තිබෙනවා නේද? පියා විසින් සැබවින්ම අපව වඩාත් ශ්‍රේෂ්ඨ බවට පත් කරවන බව ඔබ දන්නවා. අපි නැවත වරක්, උසස්ම නීති මාලාව අනුගමනය කරන, වඩාත්ම උසස් ජීව බවට පත් වෙමින් සිටිනවා. අප නැවත වතාවක් උපත් 84හි චක්‍රය වටා ගොස් තිබෙනවා. මෙම දැනුම ඔබගේ බුද්ධිය තුළ තිබේ. වෙනත් කිසිම ආධ්‍යාත්මික රැස්වීමක මෙය විස්තර කර නොදෙයි. ඔබ මෙය බවට පත් විය යුතු බව, ඔබට වැටහෙයි. ඔබව මෙය බවට පත්කළ හැක්කේ ඒකායන පියාට පමණයි. ඔබට ලක්ෂ්මී සහ නාරායනගේ පිංතූරය ඉතා හොඳින් විස්තර කළ හැක. යෝගා බලයෙන්, බ්‍රහ්මගේ මාර්ගයෙන්, ඔවුන් සැබවින්ම එම තත්ත්වය හිමි කරගත්තා. ඔබ මෙය ඔබගේ බුද්ධිය තුළ ඉස්මතු කළ යුතුයි. බ්‍රහ්ම සහ සරස්වතී මෙන්ම ලක්ෂ්මී සහ නාරායනගේ ස්වරූප දෙක පෙන්වා තිබේ. බ්‍රහ්ම සහ සරස්වතී සමඟම, පුරවැසියන්ද පෙන්විය යුතුයි. සෑම කරුණක් ගැනම ඉතා හොඳින් සිතා බලන්න. පියා පවසන්නේ මා සිහි කරන්න. ඔහු බ්‍රහ්මටද පවසන්නේ මා සිහිපත් කරන්න, එවිට ඔබ මෙය වෙයි. බ්‍රහ්මගේ මුඛයෙන් උපන් සියලුම නිර්මාණයට ඔහු පවසන්නේ මා සිහි කරන්න. ඔහුව සිහිපත් කළ යුත්තේ කෙසේද කියා, ඔබගේ බුද්ධි තුළ තිබේ. පිංතූර තිබෙන්නේ ඔබ ඉදිරියේය. ඒවා භාවිත කරමින්ද මෙය

විස්තර කිරීම ඉතා පහසුයි. පියාගේ හැඳින්වීම ලබා දෙන්න. ප්‍රදර්ශන වලදීද මෙම පිංතූර විස්තර කරන්න. එම ඒකායන කෙනා සැබවින්ම සියල්ලන්ගේම අසීමිත පියාය, යන විශ්වාසය ඔබට තිබේ. මෙයට අනුව, අපට අසීමිත උරුමය හිමි විය යුතුයි. අශාරීරික ජීවාත්ම වන අප, සහෝදරයන්ය. ශාරීරික වන විට, අප සහෝදරයන් සහ සහෝදරියන් වෙයි. අපට ඉගෙන ගත හැකි වන්නේ එවිට පමණයි. සහෝදර සහෝදරියන් වන්නේ බ්‍රහ්මගේ දරුවන්ය. ඔබට උරුමය හිමි වන්නේ පියාගෙනි. මෙය ඔබගේ බුද්ධිය තුළ සනිටුහන් කරගන්න. මෙය ඕනෑම කෙනෙකුට විස්තර කර දෙන්න. ප්‍රථමයෙන්ම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. අපි සහෝදර පිරිසකි. ඔබ සර්වව්‍යාප්තික බව ගැන කතා කරන විට, එය පීතෘත්වයක් වෙයි. පීතෘත්වයකට, උරුමයක් ලැබෙන්නේ කෙසේද? සැම කෙනෙක්ම පියෙක් බව කීමෙන්, ඔබ පහළට වැටී ඇති අතර උරුමයක් ලැබී නැත. මෙය සහෝදරත්වයක් බව දැන් වටහාගැනීමෙන්, ඔබට උරුමය හිමි වෙයි. ඔබ මෙය හොඳින් විස්තර කරන විට, අන්‍ය විශේෂ දේවතාවන් ගැන මිනිසුන්ගේ බුද්ධියේ ඇති දේ ඉවත් වෙයි. ඔවුන්ට පියවරුන් දෙදෙනෙක් සිටින බව පවසන්න එම කෙනා, සැම කෙනෙකුටම විමුක්තිය ලබාදෙන ආධ්‍යාත්මික පියාය. සාමයේ සහ සතුටේ උරුමය ලබා දෙන්නේ ඔහුම පමණක් වන අතර ඉන්පසුව සැම කෙනෙක්ම සතුටට පත් වෙයි. ඔහුට, දිව්‍ය ලෝකය නිර්මාණය කරන, දිව්‍යමය දෙවි පියාණන් යැයි කියයි. ප්‍රථමයෙන්ම ඔවුන්ගේ බුද්ධිය මත, පියාගේ බලපෑම ඇති කරන්න. එම කෙනා ජීවාත්මයන්ගේ අසීමිත පියාය. පාරිශුද්ධකරු යැයි අමතන්නේ ඔහුට පමණක්මයි. ඔය සියලුම ජීවාත්ම, පරම පියා, පරමාත්ම ජීවයගේ දරුවන්ය. මෙම විශ්වාසය ස්ථිර කරගන්න. ප්‍රථමයෙන්ම මෙම ප්‍රධාන කරුණ ඔවුන්ගේ බුද්ධියේ සනිටුහන් කරවන්න. ඔවුන්ට මෙය වැටහෙන විට පමණයි, ඔවුන්ගේ සතුටේ රසදිය කඳ ඉහළ නැඟ, එවිට ඔවුන්ට මෙසේ පැවසීමට හැකි වෙයි 'අපි අනිවාර්යයෙන්ම පියාව සිහි කරන්නෙමු. පියාව සිහිපත් කිරීමෙන් අප ලෝකයේ පාලකයන් බවට පත්වන විශ්වාසය අපට තිබේ.' ඔවුන්ට මෙම සතුට විශාල වශයෙන් තිබෙයි. නුවණ තිබෙන සහ බුද්ධිය තුළ සම්පූර්ණ විශ්වාසය ඇති අය, මෙසේ කියයි 'පළමුවෙන්ම අප ගොස්, දාදා තුළට ඇතුළු වන අසීමිත පියාව මුණ ගැසෙමු.' ශිව බාබාට, අපට කතා කළ හැක්කේ, බ්‍රහ්ම බාබා තුළින් පමණයි. ඔය ජීවාත්ම තවමත් ඔහුව මුණගැසී නැත්නම්, ඔබ ඔහු සිහිපත් කරන්නේ කෙසේද? දරුවන්ව දරුකමට හදාගත් විට පමණයි, ඔවුන්ට ඔහු සිහිකළ හැකි වන්නේ. ඔබව දරුකමට හදාගෙන නැත්නම්, ඔබ ඔහු සිහි කරන්නේ කෙසේද? ප්‍රථමයෙන් ඔහුට අයත් වන්න. ඔබ ක්ෂණිකව එවන් පියාව මුණ ගැසිය යුතුයි. පියා මෙසේ විමසනු ඇත තමන් ජීවාත්ම බව, ඔබ සලකනවාද? මා ඔය ජීවාත්මයන්ගේ පියාය. ශිව බාබා ඔබට කතා කරයි. ජීවාත්මය වන මාගේ පියා, ඔබගේද පියාය. සියලුම ජීවාත්මයන්ගේ පියා, සැබවින්ම එක්කෙනෙක් පමණක්ය, යන විශ්වාසය ඔබට තිබෙනවාද කියා, ඔහු ඔබගෙන් විමසයි. ඔහු ඔබට උරුමයක් ලබා දෙයි. ඔබ පිවිතුරුද විය යුතුයි. ඔහු සිහිපත් කිරීමට අමතරව, ඔබ අන් සැම දෙයක්ම අමතක කළ යුතුද වනවා. ජීවාත්ම වන ඔබලා, නිවසින් අශාරීරිකව පැමිණියා ඔබට සිරුරක් හෝ ශාරීරික නෑදෑයින් නොවීය. ජීවාත්මයක් සිරුරක් තුළට ඇතුළු වී, එම සිරුර වැඩෙන විට පමණයි, එවිට ඔහුට යමක් විස්තර කිරීමට හැකි වන්නේ මේ ඔබගේ පියාය, මේ අභවල් කෙනාය. ජීවාත්මය, සියලුම සම්බන්ධතාවයන්ගෙන් වෙන්වී සිටියි. ජීවාත්මයක්, තම සිරුර අත්හරින විට, මෙසේ කියයි ඔබ මිය යන විට, ලෝකය ඔබට මිය ගොසින්ය. ජීවාත්මය තවත් සිරුරක් ගන්නා තුරු, සැම බන්දනයකින්ම නිදහස් වෙයි. ජීවාත්මයක්, මවකගේ කුසක් තුළට ඇතුළු වී, ඉන්පසුව උපදියි. නෑදෑකමක් පිළිබඳ ප්‍රශ්නයක් මතු වන්නේ ජීවාත්මයකට නුවණ ඇති වන විට පමණයි. ඔය දරුවන් මෙහිදී මෙයත් විස්තර කළ යුතුයි. ජීවමානව සිටින අතර, සැම දෙයක්ම අමතක කරන්න. ඒකායන පියා සිහිපත් කිරීමට අමිශ්‍ර සිහි කිරීම යැයි කියයි. යෝගා ලෙස හැඳින්වෙන්නේ මෙයයි. මෙහි මනුෂ්‍යයන්ට තව බොහෝ දෙනෙක් සිහි වෙයි. ඔබට අමිශ්‍ර සිහි කිරීම ඇත. ඒ සියලුම ශාරීරික නෑදෑකම් විනාශ වීමට යන බවත්, අපගේ සබඳතාවය තිබෙන්නේ ඒකායන පියා සමඟ පමණක් වන බවත් ජීවාත්මය දනී. ඔබ පියා වැඩියෙන් සිහිපත් කරන තරමට, ඔබගේ පාපයන් වැඩියෙන් දුරු වනු ඇත. ඔබගේ නෑදෑ මිතුරන් සිහි කිරීමෙන් ඔබ පාපයක් සිදු කරනවා නොවෙයි නැහැ. පාපයන් සිදුවන්නේ, ඔබ වැරදි ක්‍රියා සිදුකරන විටයි. වෙනත් ජීව සිහි කිරීමෙන් ඔබට පාපයක් සිදුවන්නේ නැත, නමුත් කාලය නිසැකයෙන්ම අපතේ යනු ඇත. ඒකායන පියා සිහි කිරීමෙන් ඔබගේ පාපයන් දුරු වෙයි. ඔබගේ පාපයන් කපා ගැනීමට ඇති මාර්ගය මෙයයි. කෙසේවෙතත්, ඔබ ඔබගේ නෑ මිතුරන් ආදිය සිහි කරයි. ඔබගේ ව්‍යාපාරික කටයුතු සහ සිරුරේ පැවැත්ම වෙනුවෙන් අන් සැම දෙයක්ම සිදු කරන්න, නමුත් ඔබට කාලය ඇති සැම විටෙකම අඛණ්ඩව පියාව සිහිපත් කරන්න, එවිට මිශ්‍ර ලෝහ ඉවත් වනු ඇත. ප්‍රධානතම දෙය මෙයයි. අපවිත්‍ර බවින් පිවිතුරු වන්නේ කෙසේද කියා ඇතුලාන්තයෙන් සිතන්න. ඔබ පියා සිහි කළ යුතුයි. ඔබගේ පවුලේ අය සමඟ ඔබ නිවසේ ජීවත් විය යුතුයි. සන්‍යාසීන් තම සිරුරු හලා දමා ඉන්පසුව ගෘහවාසීන්ට දාව උපත ලබයි. ඔවුන් උපතින් උපතට පිවිතුරු වනවා නොවෙයි. පාපයෙන්

තොර ලෝකය දැන් නොපවතී. මෙය දූෂිත ලෝකයයි. කිසි කෙනෙකුට ඉන් නිදහස් විය නොහැක. දූෂිත ලෝකයේ ජීවත් වන බැවින්, එක් හෝ තව දුර්වලතාවයක් නියත වශයෙන්ම තිබෙයි. කෙසේවෙතත්, ඇත්තේ ලෝක දෙකක් පමණයි එකක් දූෂණයෙන් තොර වන අතර අනෙක දූෂිතයි. දේවතාවන් වාසය කරන්නේ පිවිතුරු ලෝකයේය. මෙය විස්තර කිරීම ඉතා පහසු විය යුතුයි. මෙම අපවිත්‍ර ලෝකය දැන් විනාශ වීමට තිබේ. විනාශය සිදු වීමට පෙර, අසීමිත පියාගෙන් ඔබගේ උරුමය හිමි කරගන්න. බාබා පවසන්නේ සියලුම ශාරීරික නෑදෑයින් අත්හරින්න, තමන් ජීවාත්මයක් යන විශ්වාසය ඇති කරගෙන පියාව සිහි කරන්න, එවිට ඔබ පිවිතුරු වෙයි. පියා පවසන්නේ ඔබ මට පාරිශුද්ධකරු යැයි කියයි. ගංගා නදියේ ස්නානය කරන අය බොහෝය. එසේ කිරීමෙන් ඔබ පිවිතුරු වන්නේ නැත. ඔබ ප්‍රදර්ශන වලදී ඉතා හොඳින් විස්තර කළ යුතුයි. ප්‍රජාපිතා, ප්‍රජාවගේ පියා, සිටිය යුත්තේ මෙහිය. පහළින්, බ්‍රහ්ම සහ බ්‍රහ්ම කුමර කුමරියන් තපස්යාවේ සිටින අන්දම පෙන්වා ඇත. ඔබ මෙම කරුණ ඉතා හොඳින් විස්තර කළ යුතුයි. ඔබ හදවතින්ම විස්තර කළ යුතුයි. කෙසේවෙතත් මතුපිටින්, දැනුම වැඩිපුර ලබා දීමෙන්, ඔබ නාමයට අපහාස කරයි. ඔබ යමක් ගැන ව්‍යාකූලත්වයට පත්වන බව ඔබ දකින විට, ඔබ වෙනත් සහෝදරියක් කැඳවන තෙක් ඔවුන්ට ඉන්නට යැයි පවසන්න. ඇතැම් අය අන් අයට වඩා දක්ෂයි. සෑම කෙනෙක්ම සෑම දෙයක්ම වාද නොකර, විස්තර කරන්නේද කියා, නිසැකව දැනගැනීමට, ප්‍රදර්ශන සහ මේලා අධීක්ෂණය කළ යුතුයි. බොහෝ විවිධ ආකාරයේ මිනිසුන් පැමිණෙන නිසා, සෑම කෙනෙක්ම හඳුනන කෙනෙක්, ඇතුල් වන ස්ථානයේ සිටිය යුතුයි. ඔබ අනිවාර්යෙන්ම ප්‍රභූවරුන්ට ගෞරව කළ යුතුයි. නියත වශයෙන්ම යම් වෙනසක් ඇතිවෙයි. අනෙකාට වඩා, මෙම කෙනාට වැඩියෙන් සෙනෙහස දක්වන බවත්, වෙනස්කම් කරන බවත් ඔබ නොසිතිය යුතුයි. මෙයට වෙනස්කම් කරනවා යැයි නොකියයි. ඇතැමුන් සිතන්නේ, මෙහි වැදගතුන්ට වැඩියෙන් සලකන බවයි. සේවය කළ හැකි අයට සැබවින්ම එම සැලකිල්ල පිදෙයි. කෙනෙක් ගොඩනැගිල්ලක් තනා දී ඇත්නම්, අනිවාර්යෙන්ම ඔහුට හොඳින් සළකා හොඳින් රැක බලාගනු ඇත. කොහොමත් ගොඩනැගිලි තැනෙන්නේ ඔබ වෙනුවෙනි. උත්සාහ දරා රජවරුන් බවට පත් වූ අයව, පුරවැසියන් ඉබේටම රැකබලා ගනිවි. උසස් තත්ත්වයක් ඇති අයට, අඩු තත්ත්වයක් ඇති අයට වඩා, අනිවාර්යෙන්ම වැඩි සැලකිල්ලකින් පුදනු ලබයි. ලෝකයේ සියලුම ජීවාත්ම, අසීමිත පියාගේ දරුවන්ය. කෙසේවෙතත්, ඔහු ඉපදී ඇත්තේ භාරතයේය. මුලින් උසස්ව සිටි භාරත ජනතාව, දැන් පහත් වී ඇත. පියා පවසන්නේ මා පැමිණ ඇත්තේ ඔබට ඉගැන්වීමටයි. මා භාරතයේ පැමිණෙන අතර සෑම කෙනෙකුටම යහපතක් සිදුවෙයි. 'විශේෂයෙන්' සහ 'සාමාන්‍යයෙන්' යැයි තිබේ. භාරතය, දැන් අපාය වන අතර, එය දෙව්ලොව බවට පත් විය යුතුයි. එබැවින් ඔහු භාරතයට පැමිණෙයි, එහෙම නේද? වෙනත් තැනකට ගොස් ඔහු කුමක් කරන්නද? විදේශයන්හි, එය පාප්වහන්සේ අයත් කරගත් රාජධානිය බැවින්, ඔවුන් විශාල පල්ලි ගොඩනැගූ ආකාරයෙන්, භක්ති මාර්ගයේ මිනිසුන් පළමුවෙන්ම ඉතාමත්ම ලස්සන දේවාලයක් සෝම්නාථට ගොඩනැගුවේ භාරතයේය. සෑම පල්ලියක්ම එක වගේ නැත ඒවා නිසැකයෙන්ම අංකානුරූප වෙයි. සෝම්නාථ දේවාලය, දියමන්ති සහ මැණික් වලින් පිරී තිබුණි. මුස්ලිම්වරුන් එය කොල්ල කා, සෑම දෙයක්ම රැගෙන ගියා. ඔබ බොහෝ ධනවත් විය. පල්ලියකින් ඔබ කුමක් කොල්ලකන්නද? මිනිසුන් මුදල් පසුපස හඹා යයි! මහමුද් ගස්නාවි බොහෝ සේ රැගෙන ගිය අතර ඉන්පසුව බ්‍රිතාන්‍යයන් පැමිණියා. ඔවුන්ද ධනය පිටරටට දිගටම යැවූ අතර බොහෝ රැගෙන ගියහ. ඔබට දැන් එය නැවතත් ආපසු ලැබෙමින් පවතිනවා. ඔවුන් රුපියල් බිලියන ගණනනින් ලබා දෙයි. ඔබට මේ සියල්ල අවශ්‍ය වෙලාවට ලැබෙමින් පවතිනවා. ඔබට ඔබගේ ගිණුම නොලැබුණේ නම්, අවශ්‍ය වෙලාවකදී ඔබ පැවතෙන්නේ කෙසේද? මෙම නාටකය නිර්මාණය වී ඇත්තේ කෙසේද කියා, පියා ඔබට විස්තර කර දෙයි. දීමේ සහ ගැනීමේ මෙම ගිණුම දෙස බලන්න. කෙසේවෙතත්, ඔය දරුවන් දැන් දිව්‍ය ලෝකයේ අධිපතියන් විය යුතුයි. බලන්න, ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය, චක්‍රය වටා යන අන්දම. මෙයත් ඔය දරුවන්ට විස්තර කර දී ඇත. ඉන්පසුව ඔබට මෙසේ කියයි දරුවනි, 'මන්මනාභව' වන්න! මේ සෑම දෙයක්ම නැවතත් ඒ ආකාරයෙන්ම සිදුවෙයි. සතෝ බවින් සෑම දෙයක්ම තමෝප්‍රධාන් වෙයි. ඔබ දිවාකල වැඩ ආදිය කළ යුතුයි. එබැවින් එම කාලය හැර, ඔබට කාලය ඇති සෑම විටෙකම, මා සිහි කරන්න. ඇතැම් විට වැඩ කරන අතරද ඔබට කාලය තිබෙයි. ඇතමුන්ගේ කාර්යය කෙසේද යත්, ඔවුන්ට තිබෙන්නේ කොල අත්සන් කිරීමයි, එපමණයි! බොහෝ දෙනෙක් බොහෝ නිදහසේ සිටියි. කෙසේවෙතත්, රාත්‍රිය ඔබගේමයි. දිවාකල, ඔබගේ සිරුරේ ජීවිකාව වෙනුවෙන් ඔබ ආදායමක් උපයාගනී. එබැවින් රාත්‍රියේ මෙම ආදායම උපයාගන්න. මෙය ඔබගේ අනාගත උපත් 21 වෙනුවෙනි. මෙවැනි කියමනකි එක් මොහොතක්, මොහොතකින් භාගයක්. හැකි තාක් පමණින් පියාගේ සිහිපත් කිරීමේ සිටින්න, එවිට ඔබ විශාල ආදායමක් උපයා ගනිවි. ඔවුන්ට සැබවින්ම විශාල වශයෙන් උපයා ගත හැකි බව, නුවණ ඇති අයට වැටහෙයි. සමහරුන් ඔවුන්ගේ වාර්තාවේ පවා මෙසේ

ලියයි මම මෙතරම් කාලයක් බාබාව සිහි කළා. අවිදු මාවතේ ඇතැම් අය, ඔවුන්ගේ දවසේ කාලසටහන ලියයි. ඔබගේ චාර්ථාව ඔබ ලියන්නේ නම්, ඔබට එම අවධානය පවත්වා ගැනීමට හැකි වෙයි. ඔබගේ කාලය අපතේ නොහරින බවටත්, ඔබ කිසිදු පාපකාරී ක්‍රියාවක් සිදු නොකර ඇති බවටත්, පරීක්ෂා කර බලන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිදු ශාරීරික ජීවියෙකු සිහිපත් කරමින් ඔබේ කාලය අපතේ නොයවන්න. පාපයට හේතු වන කිසිදු වැරදි ක්‍රියාවක් නොකරන්න.
2. ජීවමානව සිටින අතර, අන් සෑම දෙයක්ම අමතක කර දමා, ඒකායන පියාව සිහිපත් කරන්න. ඔබගේ සිරුරේ ජීවිකාව වෙනුවෙන් ක්‍රියා සිදුකරන්න. ඒ සමඟම නුවණැත්තෙක් වී, අවිනාශී ආදායමක් උපයාගන්න. සිහිපත් කිරීමේ චාර්ථාවක් තබාගන්න.

**වරදානය:** ඔබ, ඔබගේ පරිසමාප්ත අවධිය සහ මනෝ ස්ථිතිය පිළිබඳව අවධානය තබා ගනිමින් සැමවිටම උසස් ක්‍රියා කර, පරම පියාට සමාන වේවා.
සෑම ක්‍රියාවක්ම කරන විට, ඔබ සෑම මොහොතකම වේදිකාවක් මත සිටින බවට නිරන්තරයෙන් සිහිය තබා ගන්න. එවිට, ඔබගේ සෑම ක්‍රියාවක් කෙරෙහිම අවධානය යොමු කිරීමෙන්, ඔබ පරිසමාප්ත අවධියට වඩාත් සමීප වනු ඇත. එසේම, ඔබගේ වර්තමාන සහ අනාගත තත්ත්වය පිළිබඳව සිහියෙන් සිටීමෙන්, ඔබගේ සෑම ක්‍රියාවක්ම උසස් වනු ඇත. මෙම කරුණු දෙක පිළිබඳ සිහිය ඔබව පරම පියාට සමාන කරවනු ඇත. සමාන වීම තුළින්, ඔබට අන් අයගේ මනසේ ඇති සිතිවිලි පහසුවෙන් වටහා ගැනීමට හැකි වනු ඇත. ඒ සඳහා, ඔබට අවශ්‍ය වන්නේ ඔබගේ සිතිවිලි පාලනය කිරීමේ හැකියාව පමණි. ඔබගේ සිතිවිලි තුළ කිසිදු මිශ්‍රණයක් නොතිබිය යුතුය.

**පාඨය:** ඊර්ෂ්‍යාවට සහ ප්‍රාප්තීන් නොලැබීමට හේතුව වන්නේ ආශාවන්ය. සියලු ප්‍රාප්තීන් පවතින තැන සතුට පවතී.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් ඔබගේ දානපති ස්වරූපය හෙළිදරව් කරන්න.**

සෑම තත්පරයකම සහ සෑම සිතිවිල්ලකදීම, ඔබ යමක් ලබා ගත්තාද යන්න නොව, යමක් ලබා දුන්නාද යන්න පරීක්ෂා කරන්න. දිගටම දෙන්න. ඔබ පරම පියා ගෙන් ලබා ගන්න, නමුත් ඔබ දැනටමත් ලබාගෙන අවසන්ය. දැන් ඔබට ඇත්තේ දීමටයි. දීමේ කාර්යයේ ඔබ කොතරම් කාර්යබහුලව සිටිනවාද, අහිතකර සිදුවීම් වලට මුහුණ දීම ඔබට ඉතාමත්ම පහසු වනු ඇත. සියල්ල පහසු වනු ඇත, මන්ද විශිෂ්ට දානපතියෙකු වීම තුළින් ඔබට ඉබේම විශාල ශක්තියක් ලැබෙන බැවිනි.